පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

දිනය / Date: 2025.02.05 පැය 1250
දුරකථන අංකය / Tel.NO: 011-2887973
මගේ අංකය / My NO: D/Media/Out/ 211 /2025
විද්‍යුත් ලිපිනය / E-Mails: dir.media@police.gov.lk

## 77 වන නිදහස් දිනයට සමගාමීව පොලිස් ස්ථාන මට්ටමින් පැල ලක්ෂයක් රෝපණය කිරීමේ වැඩසටහන

“CLEAN SRI LANKA” වැඩසටහනට සමගාමීව පරිසර ආරක්ෂණ ක්‍රියාකාරකම් රැසක් මේ වන විට ශ්‍රී ලංකා පොලිසිය විසින් ආරම්භ කර ඇත. ඒ අනුව 2025.02.04 වන දිනට යෙදෙන 77 වන නිදහස් දිනයට සමගාමීව දිවයින පුරා පොලිස් ස්ථාන මට්ටමින් පැල ලක්ෂයක් රෝපණය කිරීමේ වැඩසටහන ගරු මහජන ආරක්ෂක අමාත්‍ය තුමාගේ උපදෙස් පරිදි වැඩබලන පොලිස්පති තුමාගේ අධීක්ෂණය යටතේ 2025.02.04 වන දින සිට ආරම්භ කෙරිණි.

ඒ අනුව පැල ලක්ෂයක් රෝපණය කිරීමේ වැඩසටහන ආරම්භ කිරීම සංකේතවත් කරමින් පරිසර ආරක්ෂණ කොට්ඨාසයේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී මනෝජ් පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් මට්ටක්කුලිය පොලිස් වසමේ කාක දූපතේ පොල් පැළ සිටුවීමේ වැඩසටහන 2025.02.04 වන දින උදෑසන 09.00ට කොළඹ දිස්ත්‍රික්කයේ පරිසර අංශයේ ස්ථානාධිපතිවරුන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදි.

වන සංරකෂණ දෙපාතර්මේන්තුව සහ රාජ්‍ය දැව සංස්ථාවේ අනුග්‍රහයෙන් මෙම පැළ පොලිස් ස්ථාන වෙත බෙදා දීම සිදු කරන ලද අතර පැල රෝපණය කිරීම සඳහා පොලිස් ස්ථාන භූමි, පොදු උද්‍යාන, වැව් රක්ෂිත, ගංඟා රක්ෂිත, වෙරළ පරිශ්‍ර ඇතුළු සුදුසු ස්ථාන ආශ්‍රිතව මෙම පැළ රෝපණය කරනු ලබයි.

අදාළ ප්‍රදේශයේ දේශගුණික තත්ත්වය හා භූමියට ගැලපෙන පරිදි ශාක තෝරාගැනීමෙන් පසු රෝපණය කරන මෙම පැළ බාහිර සත්කාර වලින් තොරව වර්ධනය වීමට හැකියාව ලැබෙන තුරු පොලිස් ස්ථාන මට්ටමින් හා ප්‍රජා පොලිස් කමිටු සාමාජිකයින්ගේ සහයෝගයෙන් යුතුව අවශ්‍ය සත්කාර කිරීම සහ රැක බලා ගැනීම සිදු කරනු ලබයි.

මෙම රුක් රෝපණ වැඩසටහන 2025.02.04 වන දින සිට ක්‍රියාත්මක වූ අතර එම වැඩසටහන් වල ඡායාරූප කිහිපයක් මේ සමඟ ඔබ වෙත යොමු කරමි.










**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**